# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்தசெயல்  நிறைவேற்றுகை
# Annual Performance Report

# 2015

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන  අමාත්‍යාංශය

சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்திஅமைச்சு

Ministry of Law & Order and Southern Development

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2015

**නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය**

13 වන මහල, සෙත්සිරිපාය - අදියර II

බත්තරමුල්ල.

# පටුන

පිටු අංකය


| | |
|---|---|
| 01. හැඳින්වීම | 01 - 05 |
| දැක්ම | 03 |
| මෙහෙවර | 03 |
| අරමුණු | 04 |
| අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය | 05 |
| 02. අමාත්‍යාංශ සමස්ථ කාර්ය සාධනය | 06 - 18 |
| 2.1. රටේ සාමාන්‍ය ජන ජීවිතයේ සාර්ථකභාවයට ලබාදුන් සහයන් අතරින් | 06– 11 |
| 2.2. විධිමත් පොලිස් සේවයක් සඳහා අමාත්‍යාංශය ප්‍රතිපත්තිමය තීරණ ගනිමින් | 12 |
| 2.3. අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනවල ප්‍රගතිය අපේක්ෂා කරමින් | 13 – 14 |
| 2.4. අධීක්ෂණය කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල කාර්ය සාධනය | 15 - 16 |
| 2.5. සමාලෝචන වසර තුළදී විෂයපථයෙන් බැහැරවූ ආයතනවල සිදුවූ ප්‍රගතීන් | 17 - 18 |
| 03. ආංශීය කාර්යසාධනය | 19 |
| 3.1. පාලන අංශය | 19 - 21 |
| 3.2. පොලිස් අංශය | 22 |
| 3.3. මූල්‍ය අංශය | 23 - 26 |
| 3.4. සැලසුම් සහ අධීක්ෂණ අංශය | 27 - 28 |
| 3.5. අභ්‍යන්තර විගණන අංශය | 29 |

## සංඛ්‍යා වගු විස්තර


| වගු අංකය | නම | පිටු අංකය |
| --- | --- | --- |
| 01 | 2015.12.31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය | 05 |
| 02 | අපරාධ වර්ග අනුව වාර්තාවීම් සහ ප්‍රගතිය | 06 |
| 03 | කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි අපරාධ වාර්තාවීම් හා විසඳීම් | 07 |
| 04 | රථවාහන අනතුරු | 07 |
| 05 | නිද්‍රාජනක ද්‍රව්‍ය | 08 |
| 06 | නිද්‍රා ජනක ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණය | 08 |
| 07 | දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි | 09 |
| 08 | විශේෂ කාර්ය බලකාය සිදුකරන ලද අනෙකුත් වැටලීම් | 10 |
| 09 | මහජන දුක්ගැනවිලි ලද හා විසඳූ සංඛ්‍යාව | 11 |
| 10 | කාර්ය මණ්ඩල වෙනස්වීම් - 2015 | 20 |
| 11 | දේශීය පුහුණු | 21 |
| 12 | විදේශීය පුහුණු | 22 |
| 13 | මුල්‍ය ප්‍රතිපාදන සහ උපයෝජනය - 2015 | 25 |
| 14 | රජයේ  නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම - 2015 වර්ෂය | 26 |

# 01. හැඳින්වීම

රටක සංවර්ධනයේ පදනම වනුයේ එරට පවතින සාමකාමී වාතාවරණයයි. සාමකාමී රටක තිරසාර සංවර්ධනය ලඟාකර ගැනීම සඳහා වූ එක් වැදගත් සාධකයක් වනුයේ සමබර සංවර්ධන පිළිවෙතයි. නිදහස් හා සාමකාමී වටපිටාවක් ස්ථාපිත කිරීමේ අරමුණ මුදුන්පත් කරගැනීම සඳහා2013/08/16 දිනැති 1823/70 අංක දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ස්ථාපිත කළ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය, මහජන ආරක්ෂාව සහ මහජන සාමය ස්ථාවර කිරීම සඳහා වගකිවයුතු වූ අතර ඊට අදාළ වූ විෂයපථය ආවරණය කරමින් සිය කාර්යයන් ඉටුකරන ලදී.

සාමකාමී රටක සමබර සංවර්ධන පිළිවෙතට අවතීර්ණ වීමේ අභිලාශය මුදුන්පත් කරගනිමින් ***"මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්"*** සංකල්පය පෙරදැරි කරගෙන 2015/01/18 දිනැති අංක 1897/15 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින්මෙම අමාත්‍යාංශ කාර්යභාරය තවදුරටත් පුළුල් කර මහජන සාමය, ආපදා කළමනාකරණ සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය ලෙස ස්ථාපිත විය. ඉන් පසු ශ්‍රී ලංකා පොලීසිය, විශේෂ කාර්ය බලකාය, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විෂය පථයට ඇතුළත් කරමින් 2015/03/09 දිනැති 1905/04 අංක දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් තවදුරටත් අමාත්‍යාංශ කාර්යභාරය පුළුල් කර මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය ලෙස ස්ථාපනය කරන ලදී. අනතුරුව 2015/09/21 වන දින 1933/13 අංක දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය ලෙස අමාත්‍යාංශ කාර්යභාරය නැවත සංශෝධනය වූ අතර ශ්‍රී ලංකා පොලීසිය, විශේෂ කාර්ය බලකාය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව හා බාල අපරාධකරුවන් සඳහා පුහුණු පාසැල් යන ආයතන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

ඒ අනුව යමින්, අප මාතෘභූමියෙහි මහජන සාමය ස්ථාවර කිරීම තුළින් සාමකාමී වටපිටාවක් නිර්මාණය කිරීමේත්, දක්ෂිණ ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා උරදෙමින් රටේ සමබර සංවර්ධනයට දායකවීමේත් වගකීම තීව්‍ර කරමින් 2015/11/24 දිනැති 1942/10 අංක දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය උදෙසා ප්‍රාදේශීය සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම මෙන්ම නීතිගරුක හා ගුණගරුක පුරවැසියන්ගෙන් සපිරි සමාජයක් බිහිකිරීම සඳහා මෙම අමාත්‍යාංශයට පැවරී ඇත්තේ විශේෂිත වූ වගකීම් සම්භාරයකි. ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා පොලීසිය, විශේෂ කාර්ය බලකාය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහ ගාලු උරුමය පදනම යන ආයතන සඳහා ප්‍රතිපත්ති සැකසීම, මඟපෙන්වීම, ක්‍රියාකාරිත්ව අධීක්ෂණය, කාර්ය සාධන ඇගයීම සහ පසුවිපරම් කටයුතු සඳහා අවශ්‍ය සියලු කාර්යයන් සිදුකරමින් අමාත්‍යාංශ වගකීම් සමුදාය ඉටුකරනු ලබයි.

## මාර්ගෝපදේශකත්වය තහවුරු කරමින්...............

"නව ව්‍යවස්ථා සංශෝධනයක් මඟින් අධිකරණ, පොලීසිය, මැතිවරණ, විගණන හා නීතිපති වැනි ආයතන වල අපක්ෂපාතීත්වය ආරක්ෂා කිරීම පිණිස ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිතකරමි."

"රාජ්‍ය සේවය, ආණ්ඩුවේ ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වන බව හා අපක්ෂපාතීව ක්‍රියා කරන බව තහවුරු කිරීම සඳහා රාජ්‍ය සේවය හා පොලීසිය සඳහා නිර්දේශපාලනික කුසලතා පදනමක් හඳුන්වා දෙන්නෙමි."

"සියලු තරාතිරම් වල පුද්ගලයන්ගේ නොමනා ක්‍රියා නිසා රටතුළ ඇදහිය නොහැකි පරිමාණයෙන් වර්ධනය වී ඇති දරුවන් හා කාන්තාවන් ගොදුරුවන අපචාර වළක්වාලීමට උපරිම ක්‍රියාමාර්ග ගන්නා අතර ඊට අදාල නඩු විභාග ඉතා කෙටි කලකදී අවසන් කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දෙන්නෙමි. එමඟින් ළමා හා කාන්තා දූෂණ සහ මුලින්ම නවතාලීමට කටයුතු කරන්නෙමි."

(මෛත්‍රී පාලනයක් ..ස්ථාවර රටක් ප්‍රතිපත්ති ප්‍රකාශනය- පිටු අංක 16)

"මත්කුඩු ජාවාරම් කරුවන් මැඩලීම සඳහා ජාතික ඔත්තු සේවය, විශේෂ කාර්ය බලකාය, ශ්‍රී ලංකා රේගුව, අන්තරායකර ඖෂධ පාලක අධිකාරිය ආදිය ඒකාබද්ධ කර විශේෂ බලකායක් ස්ථාපිත කරන්නෙමි."

"මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් ගලවා ගැනීම සඳහා සුවිශේෂී පුනරුත්තාපන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට කටයුතු කරන්නෙමි."

(මෛත්‍රී පාලනයක් ..ස්ථාවර රටක් ප්‍රතිපත්ති ප්‍රකාශනය- පිටු අංක 24)

## දැක්ම

“විනය ගරුක රටක් නීති ගරුක සමාජයක් බිහිකිරීමේ පුරෝගාමියාවීම සහ දක්ෂිණ සංවර්ධනයේ ප්‍රධාන මඟපෙන්වන්නා වීම”

## මෙහෙවර

“නීතිය හා සාමය ස්ථාපිත කිරීම, ත්‍රස්තවාදය වැළැක්වීම, මාර්ග ආරක්ෂාව හා රථවාහන පාලනය, අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීම හා පාලනය කිරීම තුළින් රටතුළ සාමකාමී වාතාවරණයක් පවත්වාගෙන යාම සහ දක්ෂිණ ප්‍රදේශයේ පවත්නා භෞතික හා මානව සම්පත් තිරසාර පැවැත්මකින් යුතුව භාවිත කරමින් දක්ෂිණ ප්‍රජාවගේ සමාජ හා ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම”

## අරමුණු

- සෑම පුරවැසියෙකුටම බියෙන් හා සැකෙන් තොරව ජීවත්විය හැකි සාමකාමී වටපිටාවක් පවත්වාගෙන යෑම සඳහා සමානාත්මතාවයෙන් හා සාධාරණත්වයෙන් යුතුව නීතිය ක්‍රියාත්මක කිරීම.
- විවිධ අපරාධ, සමාජ විරෝධී ක්‍රියා, හිංසන වැළැක්වීමට හා මැඩපැවැත්වීමට අවශ්‍ය පියවර ගැනීම.
- විවිධ අපරාධ, සමාජ විරෝධී ක්‍රියා සහ හිංසන සිදුකරන්නන් නීතියේ රැහැනට හසුකර ගැනීම තුළින් සමාජ අපරාධ බිය තුරන් කිරීම.
- ගමනාගමන යපහසු කිරීම සඳහා රථවාහන පාලනය.
- අන්තරායකාරී ඖෂධ භාවිතය, සංසරණය වැළැක්වීම සහ භාවිතාකරන්නන් පුනරුත්ථාපනය කර සමාජ ගත කිරීම.
- දක්ෂිණ ප්‍රදේශයේ අඩු ආදායම්ලාභීන් සඳහා අමතර ආදායම් මාර්ග ජනිත කෙරෙන ක්‍රියාකාරකම් ඇති කිරීම.
- දක්ෂිණ ප්‍රදේශයේ අවම යටිතල පහසුකම් ඇති කොට්ඨාශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ගුවන්තොට හා නැව්තොට ආශ්‍රිතව කර්මාන්ත හා ප්‍රවර්තන සේවා දියුණු කිරීම සඳහා ආර්ථික ඒකක ඇති කිරීම.
- දක්ෂිණ ප්‍රදේශයේ සංචාරක ආකර්ෂණ කලාප ආශ්‍රිත පහසුකම්, කර්මාන්ත හා සංචාරක සේවා දියුණු කිරීම.
- දක්ෂිණ ප්‍රදේශයේ ඇති ජාතික උරුමයන් සහ සංස්කෘතික වටිනාකමක් ඇති ස්ථාන මනා ලෙස පවත්වා ගෙන යාම.

# අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය

## 2015.12.31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය

සංඛ්‍යා වගුව - 01

| අනු අංක | තනතුර | සේවය | පන්තිය | වැටුප් පරිමාණය | අනුමත ගණන | | | 2015.12.31 දිනට සේවක ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් |
| 1 | ලේකම් | - | - | SL -2006 | 01 | | | 01 | | |
| 2 | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | Sp | SL 3-2006 | 02 | | | 01 | | |
| 3 | ප්‍රධාන මූල්‍ය නිලධාරී | ශ්‍රී.ලං.ග.සේ | SP | SL 3-2006 | 01 | | | 01 | | |
| 4 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | I | SL 1-2006 | 03 | | | 03 | | |
| 5 | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ | I | SL 1-2006 | 01 | | | 01 | | |
| 6 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | I | SL 1-2006 | 01 | | | 01 | | |
| 7 | සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ | II/III | SL 1-2006 | 01 | | | 01 | | |
| 8 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | II/III | SL 1-2006 | 03 | | | 01 | | |
| 9 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | II/III | SL 1-2006 | 02 | | | 01 | | |
| 10 | නීති නිලධාරී | දෙපාර්තමේන්තුගත | II/III | | 01 | | | | | |
| 11 | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ | Supra | MN 7-2006 A | 01 | | | | | 01 |
| 12 | භාෂා පරිවර්තක ( සිංහල-දෙමළ) | භා.ප.සේ | I/II | MN 6-2006A | 01 | | | | | |
| 13 | භාෂා පරිවර්තක ( සිංහල- ඉංග්‍රීසි) | භා.ප.සේ | Spe, I | MN 6-2006A | 01 | | | | | |
| 14 | සම්බන්ධීකරණ ලේකම් - ලේකම් | අනියම් | - | - | | 01 | | | 01 | |
| 15 | තොරතුරු සන්නිවේදන තාක්ෂණික නිලධාරී | තො.ස.තා.සේ | Class II Grade II | MN 6-2006A | 01 | | | | | |
| 16 | සංඛ්‍යා ලේඛන නිලධාරී | | I/II | | 01 | | | | | |
| 17 | සංවර්ධන නිලධාරී | සං.නි.සේ | III,II,I | MN 4-2006 A | 24 | | | 13 | | |
| 18 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ | III,II,I | MN 2-2006 A | 40 | | | 33 | | 01 |
| 19 | රියදුරු | රි.සේ | III,II,I | PL3-2006 | 15 | | | 12 | | |
| 20 | කාර්යාල කාර්ය සහයක | කා.කා.ස.සේ | III,II,I, | PL1-2006 | 18 | | | 16 | 01 | 02 |
| එකතුව | | | | | 118 | 01 | | 85 | 02 | 04 |

*මූලාශ්‍රය -අමාත්‍යාංශ පාලන අංශය*

# 02. අමාත්‍යාංශ සමස්ථ කාර්ය සාධනය

## 2.1. රටේ සාමාන්‍ය ජන ජීවිතයේ සාර්ථකභාවයට ලබාදුන් සහයන්අතරින්...

### 2.1.1. රට තුළ වාර්තාවන අපරාධ කඩිනමින් විසඳීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය හා උපායමාර්ගික මඟපෙන්වීම් ලබාදීම

සංඛ්‍යා වගු අංක 02 හි දක්වා ඇති පරිදි 2013 වර්ෂයේ වාර්තා වූ 1,172,793 ක අපරාධ සංඛ්‍යාව 2014 වර්ෂයේදී 1,180,805 ක් දක්වා වර්ධනය වී තිබුණ අතර එය සමාලෝචන වර්ෂය තුළදී 1,129,555 ක් දක්වා අඩුවී තිබීම අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පොලිසියට හා විශේෂ කාර්ය බලකාය වෙත ලබාදුන් මඟපෙන්වීම් වල යහපත් ප්‍රතිඵලයකි.

**අපරාධ වර්ග අනුව වාර්තාවීම් සහ ප්‍රගතිය**

**සංඛ්‍යා වගුව - 02**

| අපරාධවර්ගය | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| බල අපරාධ | 55,349 | 32,791 | 50,962 | 29,396 | 188,40 | 049,13 |
| සුළු වැරදි පුද්ගලයන්ට එරෙහි | 45,282 | 33,094 | 42,368 | 30,561 | 870,43 | 292,30 |
| සුළු වැරදි දේපල වලට එරෙහි | 26,138 | 15,703 | 21,827 | 11,691 | 685,30 | 407,14 |
| සුළු පැමිණිලි | 1,046,024 | 1,044,465 | 1,065,648 | 1,063,413 | 812,014,1 | 291,014,1 |
| එකතුව | **1,172,793** | **1,126,053** | **1,180,805** | **1,135,061** | **1,129,555** | **1,072,039** |
| ප්‍රතිශතය | | **96%** | | **95%** | | **95%** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

බල අපරාධ වල විසඳුම් ප්‍රගතිය වන්නේ සැකකරුවන් අත්අඩංගුවට ගත් ප්‍රමාණය වන අතර සුළු වැරදි හා සුළු පැමිණිලි වලදී ශ්‍රී ලංකා පොලීසිය මඟින් හෝ සමථ මණ්ඩලයට යොමුකර හෝ නඩු පැවරීමෙන් විසඳුම් ලබා දී අවසන් කළ ප්‍රමාණය ප්‍රගතිය ලෙස සඳහන්කර ඇත. එය 2013 හා 2014 වර්ෂ වලදී 96% ක් වූ අතර 2015 වර්ෂයේදී එම ප්‍රමාණය 95% දක්වා 1% කින් අඩු වුවත් එයද, හොඳ ප්‍රතිශතයක් ලෙස සැලකිය හැකිය.

### 2.1.2. කාන්තාවන්ට හා ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ වැළැක්වීම හා පාලනය සඳහා අවශ්‍ය සහය ලබාදීම

ළමයින්ට එරෙහිව වාර්තාවූ අපරාධ සහ ඒවාට විසඳුම් ලබාදී ඇති ප්‍රමාණයන් මෙන්ම කාන්තාවන්ට එරෙහිව වාර්තාවූ අපරාධ සහ ඒවාට විසඳුම් ලබාදී ඇති ආකාරයන් දෙස බැලීමේදී 2013 වර්ෂයෙන් 47% ක් වූ විසඳීම් ප්‍රගතිය 2014 වර්ෂයේ 42% ක් දක්වා අඩුවී ඇති බව පෙනේ. එවැනි අවස්ථාවක අමාත්‍යාංශය මඟින් අදාළ ආයතනවලට අවශ්‍ය නිසි මාර්ගෝපදේශකත්වය ලබාදීම

නිසා 2015 වර්ෂයේදී එය 68% ක් දක්වා වර්ධනය වී ඇති බව පහත වගු අංක 03 හි සඳහන් දත්ත තහවුරු කරනු ලබයි.

**කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි අපරාධ වාර්තා වීම් හා විසඳීම්**

**සංඛ්‍යා වගුව - 03**

| අපරාධ වර්ගය | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| ළමයින්ට එරෙහි අපරාධ | 6,040 | 2,109 | 5,868 | 1,648 | 5,911 | 5,102 |
| කාන්තාවන්ට එරෙහි අපරාධ | 8,320 | 4,672 | 8,434 | 4,399 | 8,288 | 4,579 |
| එකතුව | **14,360** | **6,781** | **14,302** | **6,047** | **14,199** | **9,681** |
| ප්‍රතිශතය | | **47%** | | **42%** | | **68%** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

## 2.1.3. ජනතාවගේ ජීවිත හා දේපළවල ආරක්ෂාව සැලසෙන පරිදි රථවාහන ගමනාගමනය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම

රථවාහන අනතුරු පිළිබඳ තොරතුරු පැහැදිලි කරමින් යාකර ඇති වගු අංක 04 අනුව, රටෙහි ගමනාගමනයට යොදාගෙන ඇති වාහන ප්‍රමාණයේ සීඝ්‍ර වර්ධනයක් සිදුවෙමින් පවතින අවධියක ඊට සමානුපාතිකව වාහන අනතුරු ප්‍රමාණය වර්ධනය වීමේ වේගය මේ අයුරින් පාලනයවී තිබෙනුයේ ඊට අදාළව ගනු ලැබූ වැඩසටහන් වල ප්‍රගතිය හේතුවෙන් බව පෙන්වා දිය හැකිය. ඒ අනුව රථවාහන වැරදි හා රිය අනතුරු සම්බන්ධවූවන්ට විරුද්ධව නඩු පැවරීම, දඩපත් ලබාදීම මෙන්ම රථවාහන තදබදයට පිළියම් යෙදීමට අවශ්‍ය නීතිමය පියවර ගැනීම සෘජුවම බලපා ඇති බව තහවුරුවී ඇත.

**රථවාහන අනතුරු**

**සංඛ්‍යා වගුව - 04**

| වර්ෂය | මාරක අනතුරු | බරපතල අනතුරු | සුළු තුවාල | අලාභ අනතුරු | මුළු අනතුරු | වාහන සංඛ්‍යාව | වාහන 1,000 කට අනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| **2013** | 2,190 | ,6870 | 13,525 | 15,292 | 37,877 | 5,203,678 | 7 |
| **2014** | 2,261 | 6,847 | 12,950 | 13,992 | 36,050 | 5,633,234 | 6 |
| **2015** | 2,590 | 7719 | 13,095 | 13514 | 36,918 | 6,302,141 | 6 |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

## 2.1.4. නීතිවිරෝධී මත්පැන් සහ නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි හෙළිදරව් කරගැනීමට අවශ්‍ය පියවරයන් ගැනීම

දිවයින පුරා ක්‍රියාත්මක වන නීති විරෝධී මත්පැන් සහ නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් සහ සහයන් ශ්‍රී ලංකා පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය වෙත ලබාදෙමින් ඊට අදාළ වැරදි හෙළිදරව් කරගැනීමටත් එම වැරදි වලට නීතිමය ක්‍රියාමාර්ග ගෙන අවසන් කිරීමටත් අවකාශය ලැබීම තුළ සමාලෝචිත වර්ෂය තුළ එහි ප්‍රතිශතය 97% ක් දක්වා වර්ධනය වී ඇති අයුරු පහත සංඛ්‍යා වගු අංක 05 මඟින් පැහැදිලි කරනු ලබයි.

**නිද්‍රාජනක ද්‍රව්‍ය**

සංඛ්‍යා වගුව - 05

| අනු අංක | වරද | 2013 | | 2014 | | 2015 | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| 1 | නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි වාර්තාවීම් සහ විසඳීම් | 73,383 | 70,678 | 74,366 | 71,712 | 89,996 | 87,846 |
| 2 | සුරා සම්බන්ධ වැරදි වාර්තාවීම් සහ විසඳීම් | 124,603 | 119,198 | 114,790 | 110,234 | 113,944 | 109,256 |
| **එකතුව** | | **197,986** | **189,876** | **189,156** | **181,946** | **203,940** | **197,112** |
| **ප්‍රතිශතය** | | | **96%** | | **96%** | | **97%** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

එසේම දිවයින තුළ නිද්‍රාජනක ද්‍රව්‍ය ව්‍යාප්තව ඇති ආකාරය විශ්ලේෂණය කර එමඟින් වැඩිම පැමිණිලි ලැබෙන ප්‍රදේශ හඳුනාගෙන වැටලීම් සිදුකිරීම ප්‍රමුඛත්වයෙන් සලකා කටයුතු කිරීමට අදාළ උපදෙස් ලබාදීම තුළින් රට තුළ සංසරණය වන නිද්‍රාජනක ද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමට හැකිවී ඇති බව පහත සංඛ්‍යා වගු අංක 06 මඟින් තහවුරු කරනු ලබයි.

**නිද්‍රා ජනක ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණය**

සංඛ්‍යා වගුව - 06

| නිද්‍රා ජනක ද්‍රව්‍ය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013 | | | 2014 | | | 2015 | | |
| | කි.ග්‍රෑ. | ග්‍රෑ. | මි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | ග්‍රෑ. | මි.ග්‍රෑ. | කි.ග්‍රෑ. | ග්‍රෑ. | මි.ග්‍රෑ. |
| ගංජා | 10,361 | 336 | 365 | 10,758 | 19 | 886 | 13,253 | 55 | 225 |
| අබිං | - | 496 | 150 | - | 5 | - | - | 249 | 500 |
| හෂීස් | - | 274 | 5 | 1 | 95 | 107 | 4 | 187 | 630 |
| හෙරොයින් | 337 | 859 | 965 | 312 | 549 | 4 | 44 | 521 | 89 |
| මෝෆීන් | - | 112 | 130 | - | - | 90 | - | - | - |
| කොකේන් | - | - | - | - | 2 | 964 | 81 | 672 | 333 |
| **වෙනත්** | 139 | 700 | 185 | 46 | 852 | 961 | 166 | 751 | 909 |
| **එකතුව** | **10,837** | **2,777** | **1,800** | **11,117** | **1,522** | **3,012** | **13,548** | **2,435** | **2,686** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

## 2.1.5. දූෂණ මර්දනය සඳහා අවශ්‍ය සහය ලබාදීම

වෛශ්‍යා වෘත්තීය, ගණිකා නිවාස පවත්වාගෙන යාම වැනි දූෂණ වැරදි 6 ක් මෙන්ම හොරෙන් විදුලිය ලබාගැනීම, බලපත්‍ර රහිතව විවිධ ව්‍යාපාර/කර්මාන්ත වල යෙදීම, නීති විරෝධී දැව ප්‍රවාහනය, නීති විරෝධී වැලි හා පස් ප්‍රවාහනය වැනි ව්‍යවස්ථාපිත වැරදි 31ක් වර්තමාන සමාජයේ පැවැත්මට අහිතකර ලෙස බලපාන හෙයින් ඒවා මර්දනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම 95% ඉක්මවා ඇති බව පහත සංඛ්‍යා වගු අංක 07 විදහාපායි. මෙය අමාත්‍යාංශ උපදෙස් හා සහායන් මත ශ්‍රී ලංකා පොලිසියේ හා විශේෂ කාර්ය බලකායේ දක්ෂතාවය හා කැපවීම තුළින් සිදුවී තිබීම ප්‍රශංසාත්මක තත්ත්වයකි.

**දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි**

**සංඛ්‍යා වගුව - 07**

| අනු අංක | වරද | 2013 | | 2014 | | 2015 | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | ප්‍රතිශතය |
| 1 | දූෂණ වැරදි (6) | 2,724 | 2,627 | 1,921 | 1,856 | 1,796 | 1,788 | 99.5% |
| 2 | ව්‍යවස්ථාපිත වැරදි (31) | 73,124 | 69,541 | 54,877 | 52,998 | 46,290 | 43,896 | 94% |
| එකතුව | | 75,848 | 72,168 | 56,798 | 54,854 | 48,086 | 45,684 | 95% |
| ප්‍රතිශතය | | | **95%** | | **97%** | | **94%** | |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

## 2.1.6. විශේෂ කාර්ය බලකාය සිදුකරන ලද අනෙකුත් වැටලීම්

අමාත්‍යාංශය යටතේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන විශේෂ කාර්ය බලකාය උපයෝගී කරගනිමින් රට තුළ සිදුවන අවිධිමත් හා විනාශකාරී ව්‍යාපාර මර්දනය කිරීම වෙනුවෙන් අත්අඩංගුවටගත් පුද්ගල ප්‍රමාණයන් සංඛ්‍යා වගු අංක 08 මඟින් ප්‍රකාශයට පත් කර ඇත.




*විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් වල අවස්ථාවන්*

**විශේෂ කාර්ය බලකාය සිදුකරන ලද අනෙකුත් වැටලීම්**

සංඛ්‍යා වගුව- **08**

| අනු අංක | අත් අඩංගුවට ගත් දෑ | | සිදුවීම් ප්‍රමාණය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය | අත්අඩංගුවට ගත් පුද්ගලයින් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 1 | කසල තේ | | 29 | කි.ග්‍රෑ.325,655.900 | 45 |
| 2 | ගවයින් ප්‍රවාහනය කිරීම | | 31 | ගවයින් 272 | 75 |
| 3 | පාරිභෝජනයට නුසුදුසු මාංශ | | 19 | කි.ග්‍රෑ.3,460.900 | 57 |
| 4 | අවි ආයුධ හා පුපුරණ ද්‍රව්‍ය | | 23 | මෙරට නිෂ්පාදිත අවි 16<br>රිවෝල්වර 02<br>ඩෙටනේටර් 336<br>අත් බෝම්බ 04<br>ෂොට් ගන් අවි කාට්‍රිජ් 07 | 26 |
| 5 | නීති විරෝධී මැණික් ගැරීම | | 58 | කම්ප්‍රෙෂර් යන්ත්‍ර 12<br>බැකෝ යන්ත්‍ර 22 | 125 |
| 6 | මත් ද්‍රව්‍ය සම්බන්ධ වැටලීම් | මත්පැන් | 256 | රජයේ මත්පැන් 454<br>නීති විරෝධී 16,002 | 284 |
| | | සිගරට් | 25 | 201,384 | 26 |
| 7 | වෙනත් | | 38 | - | 81 |
| එකතුව | | | **479** | | **719** |

*මූලාශ්‍රය - විශේෂ කාර්ය බලකාය*

## 2.1.7. මහජන දුක්ගැනවිලි කළමනාකරණය කිරිමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරමින්

අපරාධයක් සිදුවන අවස්ථාවකදී ඉක්මනින් ක්‍රියාත්මක වීම සඳහා පොලීසිය දැනුවත් කිරීම, පොලීසිය මඟින් ඉටු නොවුන කාරණා සම්බන්ධයෙන් සහන ලබාගැනීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක වන මෙම ක්‍රමවේදයන් මඟින් මහජනතාව සඳහා සුවිශේෂි සේවයක් ලබාදේ. එම ක්‍රමවේදයන් මඟින් ලද හා විසඳූ පැමිණිලි සංඛ්‍යාව පහත සංඛ්‍යා වගුව මඟින් පෙන්නුම් කෙරේ.



*118 හදිසි ඇමතුම් අංශය*

**මහජන දුක්ගැනවිලි ලද හා විසඳූ සංඛ්‍යාව**

**සංඛ්‍යා වගුව - 09**

| අනු අංක | කළමනාකරණ ක්‍රමවේදය | 2015 | | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | |
| 1 | පොලිස්පතිට කියන්න | 2,082 | 2,019 | 96% |
| 2 | පොලිස්පති මහජන සහන දිනය | 1,055 | 780 | 74% |
| 3 | මහජන සහන මැදිරිය | 1,881 | 1,429 | 76% |
| 4 | 119 හදිසි ඇමතුම් | 903,245 | 899,181 | 99% |
| 5 | 118 හදිසි ඇමතුම් | 155,357 | 137,300 | 88% |
| එකතුව | | **1,063,620** | **1,040,709** | |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

## 2.2. විධිමත් පොලිස් සේවයක් සඳහා අමාත්‍යාංශය ප්‍රතිපත්තිමය තීරණ ගනිමින්

### 2.2.1. පොලිස් ආඥාපනත යාවත්කාලීන කිරීම

පවත්නා පොලිස් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා 2014 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය ලබා දුන් අනුමැතිය අනුව පොලිස් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කමිටුවක් සහ ක්ෂේත්‍රයේ නිපුණතාවයන්ගෙන් යුත් බාහිර කමිටුවක් පත් කර එමඟින් ආඥාපනතට කළයුතු සංශෝධන හඳුනා ගන්නා ලදී. ඒ අනුව ආඥාපනත සංශෝධනය කිරීමකට වඩා නව පනතක් කෙටුම්පත් කිරීම අර්ථාන්විත බව එම කමිටුව මඟින් යෝජනා කරන ලදී. ගරු අග්‍රාමාත්‍යතුමා විසින්ද 2015.05.26 වන දින පැවති සාකච්ඡාවක දී නූතන යුගයට උචිතවන පරිදි නව පනතක් හඳුන්වා දිය යුතු බවට උපදෙස් දෙන ලදී. ඒ අනුව නව පනත කෙටුම්පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

### 2.2.2. පොලිස් විශ්වවිද්‍යාලයක් ස්ථාපනය කිරීම

දැනුම, ආකල්ප හා කුසලතාවයන්ගෙන් පරිපූර්ණ වෘත්තීමය වශයෙන් සංවර්ධිත පොලිස් නිලධාරියෙකු බිහි කිරීමට මහෝපකාරී වන පොලිස් විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය නීති කෙටුම්පත් සම්පාදනය කිරීම, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සහ විශ්ව විද්‍යාලය සඳහා මූල්‍යාධාර ලබාගැනීමේ කටයුතු ක්‍රියාත්මක මට්ටමේ පවතී.




*පොලිස් විශ්ව විද්‍යාලයපිහිටුවීම සඳහා පැවති සාකච්ඡාවෙහි අවස්ථාවන්*

### 2.2.3. රථවාහන තදබදය කළමනාකරණය කිරීම වෙනුවෙන්

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමක් වන රථවාහන පාලනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම පිණිස පවත්වන ලද එක් දින වැඩමුළුවක් එවකට අමාත්‍යාංශ භාර ගරු. අමාත්‍ය ජෝන් අමරතුංග මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා ඊට සම්බන්ධිත ආයතනවල සහභාගීත්වයෙන් 2015.06.06 දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී පැවතිණි.

මෙහිදී දිනෙන් දින වර්ධනය වන කොළඹ නගරය හා තදාසන්න ප්‍රදේශවල රථවාහන තදබදය සඳහා සියළු ආයතන ඒකාබද්ධ වී සියල්ලන්ටම පිළිගත හැකි ප්‍රායෝගික ක්‍රමවේදයකට එළඹිය යුතු බව තීරණය විණ. එසේම රථවාහන තදබදය කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු කෙටිකාලීන හා දිගුකාලීන යෝජනා හඳුනා ගන්නා ලදී.

එමෙන්ම පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 351 ට අනුව සීඝ්‍රයෙන් ඉහළ යන රථවාහන අනතුරු පිළිබඳ කරුණු විමර්ෂණය කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ අතුරු වාර්තාවෙහි සඳහන් කරුණු ක්‍රියාවට නැංවීමේ වැදගත්කමද අවධාරණය විය.



*රථවාහන රාජකාරීවල නිරත පොලිස් නිලධාරියෙක්*


## 2.3. අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනවල ප්‍රගතිය අපේක්ෂා කරමින්

### 2.3.1. ගිණුම් කාර්යයන් විධිමත් කිරීම උදෙසා

පොලිස් දෙපාර්මේන්තුවට අනුයුක්තව සේවය කරන ගණකාධිකාරීවරුන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 80 ක් වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ ගිණුම් කාර්යයන් විධිමත් කිරීම සඳහා නිවැරදි ගිණුම්කරණය, වාර්තාකරණය, සහ මාර්ගෝපදේශනයන් අනුගමනය කිරීම පිළිබඳ එක් දින වැඩමුළුවක් 2015.05.15 වන දින සෙත්සිරිපාය II අදියරේ ශ්‍රවණාගාරයේදී සංවිධානය කෙරිණි. ඊට අමතරව වැඩ ආකල්ප හා ධනාත්මක චින්තනය වර්ධනය කිරීම පිළිබඳවද නිලධාරීන් දැනුවත් කරන ලදී.

### 2.3.2. සැලසුම්කරණ හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම උදෙසා

සැලසුම්කරණය තුළින් අරමුණු ඉටු කර ගැනීම උදෙසා විධිමත් සැලසුම්කරණය සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියක් පවත්වාගෙනයාම පිළිබඳව අමාත්‍යාංශය යටතේ ඇති සියළුම ආයතනවල සැලසුම්කරණ නිලධාරීන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 125 ක් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2015.08.11 වන දින පැලවත්ත ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරී ශ්‍රවණාගාරයේදී පවත්වනු ලැබිණ.





*විධිමත් සැලසුම්කරණ සහ ප්‍රසම්පාදන වැඩමුළුවේ අවස්ථාවන්*

### 2.3.3. ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති සියළුම ආයතන සම්බන්ධ කරගනිමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 05ක් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී. එමඟින් එක් එක් ආයතනයන්හි ඒවාට ආවේනික වූ ගැටළු හඳුනා ගැනීමටත් ඒ සඳහා විසඳුම් සෙවීමටත් ඒවා ක්‍රියාත්මක කිරීමටත් අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමත් ඒ අනුව ඉදිරි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමටත් හැකියාව ලැබුණි.



*ප්‍රගති සමාලෝචන රැස්වීමක අවස්ථාවක්*

## 2.3.4. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දින සැමරුම

ජාත්‍යන්තර වශයෙන් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය අඩාල කිරීම සහ අන්තරායකර ඖෂධ වර්ග හා රසායන දුර්භාවිතයෙහි යෙදීම තුළින් සිදුවන අනතුරු වැළැක්වීම පිණිස පොදු ජනතාව දැනුවත් කිරීම අරමුණු කරගනිමින්, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා 8,000 ක පමණ ජනතා සහභාගීත්වයෙන් 2015.06.26 වන දින අරලියගහ මන්දිරයේදී ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දින සැමරුම පැවැත්විණ.








*මත්ද්‍රව්‍ය විරෝධී දින සැමරුමේ අවස්ථාවන්*

## 2.4. අධීක්ෂණය කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල කාර්යසාධනය

- පොලිස් හා විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගේ නේවාසික පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම්සපුරාලීම පිණිස ඉංජිනේරුමය කාර්යයන් පිළිබද මධ්‍යම උපදේශක කාර්යාංශය අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලද පෙරසවි නිවාස ව්‍යාපෘතිය මඟින් පොලිස් දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි 399 ක් හා විශේෂ කාර්ය බලකායේ ගොඩනැගිලි 142 ක් ඉදිකර ඇත.



*ඉදි කරන ලද පෙරසවි නිවාස වල ඇතුළත හා පිටත දර්ශන*

- පොලිස් නිලධාරීන් වෘත්තීයමය වශයෙන් සංවර්ධනය කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් නංවාලීම පිණිස කටාන පොලිස් අභ්‍යාස විද්‍යාලය සහ කළුතර පොලිස් විද්‍යාලයේ සංවර්ධනය සඳහා රුපියල් මිලියන 41 ක් වැය කරමින් ගොඩනැගිලි 02 ක වැඩ නිමකර ඇති අතර ගොඩනැගිලි 17ක වැඩ කරගෙන යනු ලැබේ.





*ඉදි කරන ලද ගොඩනැගිලි වල දර්ශන*

- පොලිස් දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන පද්ධතිය සංවර්ධනය කිරීම හා නව තාක්ෂණය දෙපාර්තමේන්තුවට හඳුන්වා දීම යටතේ පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පහසු කරලීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් පිහිටුවීමේ මූලික කටයුතු අවසන් කර ඇත.



- අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකා පොලීසියේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම උදෙසා රු.මි. 592 ක් වැයකරමින්නව පොලිස් ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු කරන ලදී. ඉදිකළ ගොඩනැගිලි අතර ඇල්ල, දෙනියාය, කටාන, බදුල්ල, අඹන්පොල, පේදුරුතුඩුව, වැල්ලව, වීරවිල යන පොලිස් ස්ථාන හා තංගල්ල පොලිස් අධිකාරී කාර්යාලය, පානදුර පොලිස් අධිකාරී කාර්යාලය, මහව සහකාර පොලිස් අධිකාරී කාර්යාලය, නුවරඑළිය පොලිස් පරීක්ෂක සංචාරක නිවස්නය, නුවරඑළිය කනිෂ්ඨ පොලිස් සංචාරක නිවස්නය යන ගොඩනැගිලි වේ.




පේදුරුතුඩුව පොලිස් ස්ථානය



නුවරඑළිය කනිෂ්ඨ පොලිස් සංචාරක නිවස්නය

- විශේෂ කාර්ය බලකායේ පවතින ගොඩනැගිලි ගැටළුවට විසඳුම් ලබා දෙමින් රුපියල් මිලියන 44.32 ක් වැයකර ගොඩනැගිලි 18ක් ඉදිකර ඇත. ඒ අතර ගෝනහේන කඳවුරේ වැසිකිළි පද්ධතිය, කටුකුරුන්ද පිහිණුම් තටාකයේ ප්‍රේක්ෂකාගාරය, මූලස්ථාන තෙමහල් ගොඩනැගිල්ල, අම්පාර කඳවුරේ ප්‍රධාන ගේට්ටුව හා ඉදිරිපස වැට, හපුතලේ කඳවුරේ ඉදිරිපස මාර්ගය සහ ගේට්ටුව දැනට සම්පූර්ණයෙන්ම නිම කර ඇති අතර අනෙකුත් ඉදිකිරීම් නිම කරමින් පවතියි.





විශේෂ කාර්ය බලකායේ මූලස්ථාන කාර්යාල ගොඩනැගිල්ල

## 2.5 සමාලෝචන වසර තුළදී විෂයපථයෙන් බැහැරවූ ආයතනවල සිදුවූ ප්‍රගතීන්

### 2.5.1. අන්තර්ජාතික සහයෝගීතාවය වර්ධනය කරගනිමින් ........

සමාලෝචිත කාලය තුළ අන්තර්ජාතික සම්බන්ධතාවය වර්ධනය කර ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකාව හා රුසියානු සමූහාණ්ඩුව අතර රාජකාරි හා රාජතාන්ත්‍රික ගමන් බලපත්‍ර හිමියන්ට දෙරටට ඇතුල්වීමේදී වීසා ලබා ගැනීමෙන් එක්තරා කාලසීමාවකට නිදහස් කිරීම සම්බන්ධ අවබෝධතා ගිවිසුමක් ඇති කරගන්නා ලදී.




*රුසියානු සමූහාණ්ඩුව සමඟ ගිවිසුමට එළැඹී අවස්ථා*

### 2.5.2. විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා මූලික පියවර ගනිමින්


වයස අවු. 15 හා ඊට වැඩි සියළු පුරවැසියන්ට විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත්කිරීමත්, තොරතුරු සත්‍යාපනය කිරීම හා හුවමාරු කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කිරීමත් අරමුණු කරගනිමින් ජාතික පුද්ගල නාමලේඛනය ස්ථාපිත කිරීම හා විද්‍යුත් ජාතික හැඳුනුම්පත නිකුත්කිරීමේ ව්‍යාපෘතිය ප්‍රාරම්භක කාර්යයන් වන අදාළ නීතිමය අනුමැතින් ලබාගැනීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා බඳවා ගැනීම ප්‍රාදේශීය කාර්යාල ශක්තිමත් කිරීම, දත්ත රැස්කිරීම, ඡායාරූප ලබාගැනීම සඳහා පුහුණු කිරීම යනාදී කාර්යයන් සමාලෝචන වසරතුළ සිදුකිරීම.




*ග්‍රාම නිලධාරීන් සඳහා ඇඟිලි සළකුණු ගැනීම පුහුණුකිරීමේ වැඩමුළුවක්*

### 2.5.3. බන්ධනාගාර නියාමකයින් පුහුණු කිරීම

බන්ධනාගාර ඉතිහාසයේ සියවන බන්ධනාගාර නියාමක කණ්ඩායම (නිලධාරින් 208 දෙනෙකු) සිය පුහුණුවෙන් පසු 2015.09.15 දින එවකට නීතිය හා සාමය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති උත්සවයේදී සිය විසිරයාම සනිටුහන් කෙරිණ.



නිලධාරින් විසිරයාමේ උත්සවයේ අවස්ථාවක්

### 2.5.4. දේවස්ථාන ඉදිකිරීම හා පුනරුත්ථාපනය සඳහා සංවර්ධන සහයයන් ලබාදීම

වාසලකෝට්ටේ, ශාන්තඅන්තෝනි මුණිතුමන්ගේ සිද්ධස්ථානය, මරදමඩු මාතාවන්ගේ ජාතික සිද්ධස්ථානය ඇතුළු දිවයින පුරා දේවස්ථාන 33 ක් සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

### 2.5.5. ස්වයංක්‍රීය ඇඟිලි සලකුණු ක්‍රමය පිළිබඳ පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම

අපරාධකරුවන්ගේ ඇඟිලි සලකුණු ස්වයංක්‍රීයව හඳුනාගැනීමේ ක්‍රමවේදයන් පිළිබඳව අපරාධ ස්ථාන පරීක්ෂා කරනු ලබන පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වැඩමුළුවක් අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය මත පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් පොලිස් නිලධාරීන් සඳහා ක්‍රියාත්මක කරනු ලැබීය. මෙමඟින් අපරාධකරුවන් නීතියේ රැහැනට හසුකරගැනීම වේගවත් කිරීම තුළින් අපරාධ විසඳීමේ වේගය වැඩිකිරීම අපේක්ෂා කෙරේ.





පොලිස් නිලධාරින් දැනුවත් කිරීමේ වැඩමුළුවේ අවස්ථාවන්

# 03. ආංශීය කාර්ය සාධනය

## 3.1. පාලන අංශය

- අමාත්‍යාංශයේ සියළුම ආයතනික සහ අභ්‍යන්තර පරිපාලන කටයුතු පාලන අංශය මඟින් සිදු කරනු ලබයි.
  - අමාත්‍යාංශයේ විෂය පථය සංශෝධනය වීම පදනම් කරගනිමින් අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් නව තනතුරු 26 ක් අනුමත කරවා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදී.
    - අතිරේක ලේකම් - 01
    - ප්‍රධාන මූල්‍ය නිලධාරී - 01
      ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - 01
    - ගණකාධිකාරී - 01
    - නීති නිලධාරී - 01
    - සංඛ්‍යාලේඛන නිලධාරී - 01
    - සංවර්ධන නිලධාරී - 10
    - රාජ්‍ය කළමනාකරණ සහකාර - 10
  - වර්ෂය තුළදී සංඛ්‍යා වගු අංක 10 පරිදි අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් සිදු වූ අතර ඊට අදාළව සිදු කළ යුතු කටයුතු පාලන අංශය මඟින් සිදු කරන ලදී.

**කාර්ය මණ්ඩල වෙනස්වීම් - 2015**

**සංඛ්‍යා වගුව - 10**

| අනු අංක | තනතුර | සේවය | අනුමත සේවක සංඛ්‍යාව | ස්ථාන මාරුවී ගිය නිලධාරීන් | විශ්‍රාමගිය නිලධාරීන් | ඉල්ලා අස්වූ නිලධාරීන් | ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් |
|---|---|---|---|---|---|---|---|
| 1 | ලේකම් | | 01 | 02 | - | - | 02 |
| 2 | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | 02 | 02 | - | - | 02 |
| 3 | ප්‍රධාන මූල්‍ය නිලධාරී | ශ්‍රී.ලං.ග.සේ | 01 | - | - | | |
| 4 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | 03 | - | - | - | 01 |
| 5 | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | 01 | 01 | - | - | 01 |
| 6 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | 01 | - | - | - | 01 |
| 7 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | 03 | 03 | - | - | 02 |
| 8 | සංවර්ධන නිලධාරී | සං.නි.සේ. | 24 | 01 | - | - | 03 |
| 9 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. | 40 | 02 | - | - | 09 |
| 10 | රියදුරු | රි.සේ. | 15 | 04 | - | - | 05 |
| 11 | කාර්යාල කාර්ය සහයක | කා.සේ.සේ. | 18 | 01 | - | - | 03 |

*මූලාශ්‍රය -අමාත්‍යාංශ පාලන අංශය*

- කාර්ය මණ්ඩලයේ දැනුම, තාක්ෂණික හැකියාව සහ භාෂා ප්‍රවීණතාවය වර්ධනය කිරීම අරමුණු කරගෙන දේශීය පුහුණු පාඨමාලා සඳහා 2015 වර්ෂයේ නිලධාරීන් 59 දෙනෙකු යොමු කරන ලදී.

**දේශීය පුහුණු**

**සංඛ්‍යාවගුව - 11**

| පුහුණු පාඨමාලාව | යොමු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| ආයතනික සංවර්ධනය සඳහා වෘත්තීමයභාවය පිළිබඳ වැඩමුළුව - ශ්‍රී ලංකා පදනම් ආයතනය | 01 |
| මනෝ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව -කැළණිය විශ්ව විද්‍යාලය | 01 |
| කාර්යාල කළමනාකරණය හා ආකල්ප වර්ධනය | 12 |
| මානව සම්පත් කළමනාකරණය | 04 |
| ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්ය පටිපාටික රීති | 15 |
| ව්‍යාපෘති කළමනාකරණය | 01 |
| රජයේ නිලධාරීන් දැනුවත් වියයුතු නීති පිළිබඳ | 05 |
| රජයේ ඉඩම් කළමනාකරණය | 01 |
| රජයේ විගණන කටයුතු | 03 |
| රජයේ ගෙවීම් පටිපාටිය | 02 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන හා කළමනාකරණය | 01 |
| ව්‍යාපාර ලිපි ලිවීමේ නිපුණතාවය | 01 |
| රජයේ ගිණුම් පටිපාටිය | 07 |
| වැටුප් පරිවර්තනය | 01 |
| විශ්‍රාම වැටුප් කටයුතු | 04 |
| **එකතුව** | **59** |

*මූලාශ්‍රය -අමාත්‍යාංශ පාලන අංශය*

- 2015 වර්ෂය තුළ අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් 04 දෙනෙකු විදෙස් පුහුණු සහ සමුළු සඳහා සහභාගී වී ඇති අතර ඒ පිළිබඳ තොරතුරු පහත වගු අංක 12 මඟින් දැක්වේ.

**විදේශීය පුහුණු**

**සංඛ්‍යා වගුව - 12**

| නිලධාරියාගේ නම | තනතුර | රට | පුහුණු පාඨමාලාව | කාලය |
|---|---|---|---|---|
| ටී.එම්.කේ.බී. තෙන්නකෝන් මහතා | ලේකම් | ඕස්ට්‍රේලියාව | අන්තවාදී හිංසනයට එරෙහි ප්‍රාදේශිය සමුළුව | දින 04 |
| ආනන්ද හෙට්ටිආරච්චි මහතා | ප්‍රධාන මූල්‍ය නිලධාරී | එ.ජනපදය | මූල්‍ය කළමනාකරණය | සති 02 |
| වි.කේ.එච්.කෝලිත මහතා | ප්‍රධාන ගණකාධිකාරී | එ.ජනපදය | මූල්‍ය කළමනාකරණය | සති 02 |
| ඕෂධ ගුණතිලක මහතා | සහකාර ලේකම් | මියන්මාරය | බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බහුපාර්ශවීය ගිවිසුම පිළිබඳ රැස්වීම (බිම්ස්ටෙක්) සමුළුව | දින 03 |

*මූලාශ්‍රය -අමාත්‍යාංශ පාලන අංශය*

- අමාත්‍යාංශයේ කටයුතු කාර්යක්ෂම ලෙසින් හා මහජන හිතකාමී ස්ථානයක් ලෙස පවත්වාගෙන යාම අරමුණු කර ගෙන අමාත්‍යාංශයට අවශ්‍ය වන කාර්යාලීය උපකරණ සහ ලී බඩු මිලදී ගැනීම සම්බන්ධ රාජකාරී කටයුතු ද, කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීම හා මනා ලෙස පවත්වාගෙන යාමද, ජල බිල්පත්, විදුලි බිල්පත් හා කාර්යාල කුලී නිරවුල් කිරීම සම්බන්ධ කටයුතු ද පරිගණක ඡායාපිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, වාහන ආදියෙහි අළුත්වැඩියා සහ සේවා කටයුතු ද සිදු කිරීම.

- ආයතන හා පරිපාලන කටයුතු වලට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 7ක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර අදාළ කටයුතු සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගෙන තිබේ.

- අමාත්‍යාංශය සඳහා නව පරිශ්‍රයක් ලබාගැනීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම.

- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පොලීසිය, විශේෂ කාර්ය බලකාය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සහ ගාලු උරුමය පදනම යන ආයතනවල ආයතනික සහ පරිපාලනමය කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

## 3.2. පොලිස් අංශය

- පොලිස් නිලධාරින්ගේ ආයතන හා විනය කටයුතු පිළිබඳව අදාළ කටයුතු සිදු කිරීම.

- පොලිස් නිලධාරීන්ගේ සියළුම තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය කර විධිමත්ව සැකසීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත.

- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගතයුතු අමාත්‍ය මණ්ඩල සංදේශ 58 ක් සකස් කර ගරු අමාත්‍යතුමාගේ අත්සනින් යුතුව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම.

- පොලිස් කොට්ඨාශ, වසම්, පොලිස් ස්ථාන, මුරපොල අළුතින් ඇති කිරීම හෝ සංශෝධනයට අදාළ කටයුතු සිදු කිරිම යටතේ පොලිස් මුරපොල වශයෙන් පැවති සිලාවතුර, මැදගොඩ, මාමඩුව, පුරවසන්කුලම්, උලුක්කුලම්, පරයාන්කුලම් යන ස්ථාන පොලිස් ස්ථාන ලෙස නම් කිරීමටත් කටාන නව පොලිස් ස්ථානයක් ස්ථාපිත කිරීමටත් කටයුතු කරන ලදී.

- පොලිස් ආරක්ෂාව, ප්‍රභූ ආරක්ෂාව සහ ප්‍රභූ ආරක්ෂක පෙරගමන් රථ ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- පොලිස් ස්ථාන, මුරපොල, විශේෂ කාර්ය බලකා කඳවුරු වලට අදාළව ඉඩම් 479 ක් අත්පත් කර ගැනීම, පවරා ගැනීම සම්බන්ධ මූලික කාර්යයන් ඉටු කිරීම.

- එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා රාජකාරි සඳහා ශ්‍රී ලංකාවෙන් යොමුකරන පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ප්‍රමාණය ඉහළ නැංවීමේ යෝජනාවලියක් එක්සත් ජාතීන්ගේ කාර්යාලය වෙත විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් යොමුකර අනුමැතිය ලබාගන්නා ලදී.

- පොලිස් නිලධාරීන් එක්සත්ජාතීන්ගේ සාමසාධක හමුදා රාජකාරී සඳහා සහභාගී කරවීමට අදාළ කටයුතු කිරීම. ඒඅනුව 2015 වර්ෂය තුළ පොලිස් නිලධාරීන් 26 දෙනෙකු එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා රාජකාරී සඳහා සහභාගී කරවන ලදී.

- සමාලෝචිත වර්ෂය තුළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විසින් පාර්ලිමේන්තුව කල් තබන අවස්ථාවලදී අසන ලද ප්‍රශ්න සම්බන්ධයෙන් පිළිතුරු වාර්තා 23 ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් ( ඔම්බුඩ්ස්මන්) යන ආයතන වෙතින් ඉල්ලුම් කරන ලද නිර්දේශ වාර්තා ලබා දීමේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- 1984 අවසාන වරට සංශෝධනය කිරීමෙන් පසු මේ දක්වා කිසිදු සංශෝධනයක් කිරීමෙන් තොරව ක්‍රියාත්මක වන පොලිස් ආඥාපනත වෙනුවට නව පොලිස් පනතක් පිළියෙල කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- අධිකරණ විද්‍යාව පිළිබඳ කටයුතු කරන ආයතන හා නිලධාරීන්ගේ අධිකරණ විද්‍යාව පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීමේ අරමුණින් අධිකරණ අමාත්‍යාංශය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ අප අමාත්‍යාංශය ඒකාබද්ධව කොරියානු අන්තර්ජාතික සහයෝගීතා නියෝජිත ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

## 3.3. මූල්‍ය අංශය


- 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන ඵලදායි ලෙස කළමනාකරණය කළ අතර ඒ අනුව අමාත්‍යාංශ මූල්‍ය ප්‍රගතිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් 85% කි (පුනරාවර්තන වියදම් 98%, ප්‍රාග්ධන වියදම් 71%).


**මූල්‍ය ප්‍රතිපාදන සහ උපයෝජනය - 2015**

**සංඛ්‍යා වගුව - 13**
**රු.’000**

| ව්‍යාපෘතිය | වියදම් වර්ගය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | මු.රෙ 66 මාරු කිරීම් | ශුද්ධ ප්‍රතිපාදන | මුළු වියදම | වියදමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | පුනරාවර්තන | 27,700 | 3,663 | 31,363 | 30,193 | 99% |
| | ප්‍රාග්ධන | 2,300 | 550 | 2,850 | 2,524 | 88% |
| අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා | පුනරාවර්තන | 297,950 | 6,474 | 304,424 | 290,162 | 95% |
| | ප්‍රාග්ධන | 49,010 | 550 | 48,460 | 27,769 | 57% |
| විශේෂ කාර්ය බලකාය | පුනරාවර්තන | 5,758,200 | 540,000 | 6,298,200 | 6,245,662 | 99% |
| | ප්‍රාග්ධන | 928,000 | - | 928,000 | 673,853 | 72% |
| රාජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලය | පුනරාවර්තන | 6,859 | - | 6,859 | - | 0% |
| | ප්‍රාග්ධන | 626 | - | 626 | - | 0% |
| මුළු එකතුව | පුනරාවර්තන | 6,090,709 | 550,137 | 6,640,846 | 6,566,017 | 98% |
| | ප්‍රාග්ධන | 979,936 | - | 979,936 | 704,146 | 71% |

*මූලාශ්‍රය -අමාත්‍යාංශ මූල්‍ය අංශය*



## ➢ මූල්‍ය කටයුතු පවත්වා ගෙන යාම

- 2016 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේදී මෙම අමාත්‍යාංශය යටතේ පැවති පොලිස් දෙපාර්තමේන්තුව, විශේෂ කාර්ය බලකාය, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යන ආයතනයන් හි අයවැය ඇස්තමේන්තු ද රැස් කර 2015.07.20 දින අමාත්‍යාංශ ලිපි අංක POD/ACC/13/15 යටතේ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කර ඇත.

- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් වියදම් හා ලැබීම් සීමාවන් මනා ලෙස කළමනාකරණය කරගනිමින් පවත්වාගෙන යන ලදී.

**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම - 2015 වර්ෂය**

**සංඛ්‍යා වගුව - 14**

**රු.'000**

| කාරණය | වියදමෙහි උපරිම සීමාව | ලැබීමේ අවම සීමාව | උපරිම හර ශේෂ සීමාව |
|---|---|---|---|
| **විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන්** | 20,000 | 10,500 | 618,000 |
| **වර්ෂය අවසානයේ තත්‍ය අගයන්** | 975 | 11,404 | 167,733 |
| **එකතුව** | 20,975 | 21,904 | 785,733 |

*මූලාශ්‍රය - අමාත්‍යාංශ ගිණුම් අංශය*

- මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළයුතු පහත වාර්තා අදාළ කාල සීමාවන් තුළ නියමිත පරිදි යොමු කිරීමට කටයුතු කිරීම.
    - වාර්ෂික අත් මුදල් ඉල්ලුම් පත්‍රය - මාසයේ වැඩ කරන පළමු දිනයන්හිදී
    - මාසික අත් මුදල් ඉල්ලුම් පත්‍රය - සෑම මාසයකම වැඩ කරන පළමු දිනයන්හිදී
    - මාසික ගිණුම් සාරාංශය - සෑම මසකම මුල් දින 02 තුළදී
    - වැටුප් හා සේවක සංඛ්‍යා පිළිබඳ වාර්තාව - සෑම මාසයකම මුල් දින 02 තුළදී

- විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු මාසික බැංකු සැසඳුම් වාර්තා සෑම මසකම 15 වන දිනට පෙර ඉදිරිපත් කිරීම.

- අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ කටයුතු, මුදල් රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ හා නියෝග වලට අනුකූලව පවත්වාගෙන යන ලද අතර මේ අනුව සියළුම ලැබීම් ගෙවීම් කටයුතු හා ගිණුම් කටයුතු නිසි ලෙස පවත්වාගෙන යන ලදී.

- 2014 වර්ෂයේ විසර්ජන ගිණුම් වාර්තාව සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම සකස්කර 2015.03.31 දිනට පෙර අදාළ ආයතන වෙත ඉදිරිපත් කර ඇත.

## ➢ අමාත්‍යාංශය සහ ඒ යටතේ පැවති දෙපාර්තමේන්තුවලට අයත් ප්‍රසම්පාදනයන් සිදු කිරීම

### ▪ පොලිස් දෙපාර්තමේන්තුව

- නාරාහේන්පිට පොලිස් රෝහල් ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ ඉතිරි වැඩ නිමකිරීම සඳහා වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව රු.මි. 220.22 (වැට් රහිත) කට ප්‍රදානය කිරීමට අදාළව ප්‍රසම්පාදන තීරණ ගනු ලැබීය.

- මරදාන තනිකඩ හටනිවාස ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ ඉතිරි වැඩ නිමකිරීම සඳහා වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවරු.මි. 244.83 (වැට් රහිත) අදාළව ප්‍රසම්පාදන ලියවිලි අනුමත කිරීම සම්බන්ධයෙන් තීරණ ගනු ලැබීය.

- පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් කොස්තාපල්/ පොලිස් සැරයන්වරුන් සඳහා හම් සපත්තු 100,000 ක් මිලදී ගැනීම (ඇස්තමේන්තු ගත පිරිවැය රු.මි. 375) සඳහා වන ප්‍රසම්පාදනය වෙනුවෙන් ඊට අදාළව ප්‍රසම්පාදන ලියවිලි අනුමත කිරීම සම්බන්ධයෙන් තීරණ ගනු ලැබීය.

### ▪ බන්ධනාගාර දෙපාර්තමේන්තුව

- බන්ධනාගාර රැඳවියන් සඳහා ආහාර ද්‍රව්‍ය (අමු සහ වියළි සලාක) මිලදීගැනීම 2015/16 ප්‍රසම්පාදනයට අදාළව 2015.09.28 දින MinLO/03/15/PRI සංදේශ අංක 62/2015 අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර එවකට ආරම්භ කර තිබූ ප්‍රසම්පාදන කටයුතු නිම වන තෙක් පෙර පැවති ප්‍රසම්පාදන ගිවිසුම් යටතේ එම ආයතනයන් ගෙන්ම මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදී.

- එසේම, මෙම බන්ධනාගාර දෙපාර්තමේන්තුව අංක 1942/10 දරණ 2015 නොවැම්බර් 24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශයේ විෂය පථයෙන් වෙනස් කරන තෙක් මෙම ප්‍රසම්පාදනයට අදාලව අවස්ථා දෙකකදී අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටුව පවත්වා ඉදිරි කටයුතු සිදු කරන ලදී.

### ▪ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව

- පොලිස් දෙපාර්තමේන්තුවට අදාළව ඉදිකිරීම් කොන්ත්‍රාත් හා මිලදී ගැනීම් සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු වාර 04 ක් පවත්වා ඇති අතර මෙහිදී ඉදිකිරීම් කොන්ත්‍රාත් 06ක් හා මිලදී ගැනීම් 03 ක් සම්බන්ධව තීරණ ගෙන ඇත.

- විශේෂ කාර්ය බලකායට අදාළ ප්‍රසම්පාදන වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු වාර 03 ක් පවත්වා ඇති අතර මෙහිදී ඉදිකිරීම් කොන්ත්‍රාත් 06 ක් හා මිලදී ගැනීම් 16ක් සම්බන්ධව තීරණ ගෙන ඇත.

- **දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශ සඳහා අනුමැතිය**
  - පොලිස් දෙපාර්තමේන්තුවට අදාළව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශයන් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය (අතිරේක අංක 28) ප්‍රකාරව ප්‍රසම්පාදන අයිතමයන් 263ක් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත.


- **ප්‍රසම්පාදන ලංසු විවෘත කිරීම**
  - 2015 වර්ෂය තුළ ලංසු විවෘත කිරීම් 06 ක් සිදු කර ඇත. ඉන් 02 ක් පොලිස් දෙපාර්තමේන්තුවට අදාළ ඉදිකිරීම් වන අතර 04 ක් විශේෂ කාර්ය බලකායට අයත් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයන් වේ.

- **ප්‍රසම්පාදන ප්‍රගති සමාලෝචන රැස්වීම්**
  - ප්‍රසම්පාදනයන්ගේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ පැන නගින ගැටළුකාරී තත්ත්වයන් නිරාකරණය කිරීමේ අරමුණින් 2015 වර්ෂය තුළදී ප්‍රසම්පාදන ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර 06කදී පවත්වා ඇත.


- **ප්‍රසම්පාදනයන්ට අදාළව ණයවර ලිපි ලබා ගැනීමට කටයුතු සැලසීම**
  - ප්‍රසම්පාදනයන්ට අදාලව 2015 වර්ෂය තුළ ණයවර ලිපි ලබා ගැනීමට අවශ්‍ය වූ අවස්ථාවන් සඳහා ඒ වෙනුවෙන් අමාත්‍යාංශය විසින් නිකුත් කළයුතු නිර්දේශ ලිපි 18 ක් පොලිස් දෙපාර්තමේන්තුව හා විශේෂ කාර්ය බලකාය වෙනුවෙන් නිකුත් කර ඇත.

## 3.4. සැලසුම් සහ අධීක්ෂණ අංශය

- 2015 වර්ෂයට අදාළව අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ 2016 වර්ෂයේ දළ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර අදාළ ආයතන වලට ඉදිරිපත් කිරීම.


ACTION PLAN - 2015
MINISTRY OF PUBLIC ORDER AND CHRISTIAN AFFAIRS

Ministry of Public Order and Christian Affairs
13th floor, Stage II
Sethsiripaya
Battaramulla


ANNUAL ACTION PLAN 2016
MINISTRY OF LAW AND ORDER

Ministry of Law and Order
13th floor, Stage II
Sethsiripaya
Battaramulla


*සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම*

- පොලිස් දෙපාර්තමේන්තුවේ සහ විශේෂ කාර්ය බලකායේ භෞතික සංවර්ධනය උදෙසා 2015 වර්ෂයේදී ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනා 16 ක් ඇගයීමට ලක් කර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශ අය වැය දෙපාර්තමේන්තුවට ලබාදීමට හැකිවන සේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගතයුතු සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සංදේශ 10 ක් සකස් කර ගරු අමාත්‍යතුමාගේ අත්සනින් යුතුව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සහ අදාළ අනුමැතිය ලද පසු එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන වෙත ලබාදීම හා ව්‍යාපෘති පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මාසික සහ කාර්තුමය ප්‍රගති වාර්තා සකස්කර ජනාධිපති ලේකම් කාර්යාලයට සහ අනෙකුත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශයේත් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වලත් වර්ෂයේ ක්‍රියාකාරකම්, සැලසුම් කළ ආකාරයෙන් ඉටුකරන්නේද යන්නත්, විචලතා ඇත්නම් ඊට හේතුත්, ගැටළු සඳහා ගතයුතු පියවර පිළිබඳවත් විමසීම සහ සාකච්ඡා කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පහක් (05) වර්ෂය තුළ පැවැත්වීම හා ඊට අදාළ පසු විපරම් කටයුතු සිදුකිරීම.




*ප්‍රගති සමාලෝචන රැස්වීමක අවස්ථාවක්*

- රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 අනුව සැකසූ අමාත්‍යාංශයේ 2014 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කිරීම සහ අනෙකුත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.




- පොලිස් දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2013 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2013 හා 2014 වර්ෂවල කාර්ය සාධන වාර්තා, ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ කාර්යසාධන වාර්තාව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ කාර්යසාධන වාර්තාව යන කාර්යසාධන වාර්තා ගරු අමාත්‍යතුමාගේ අත්සනින් යුතු ආවරණ ලිපි සමඟ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම.

- නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ 2016 අය වැය විසර්ජන පනත සාකච්ඡාවට ගනු ලැබූ 2015.12.04 දින පැවති පාර්ලිමේන්තු විවාදයේදී ප්‍රයෝජනයට ගතහැකිවනසේ ප්‍රගති වාර්තාව 2015 ප්‍රකාශනය සකස් කර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.




- ශ්‍රී ලංකා මහ බැංකුවේ 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා අවශ්‍ය තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම.

- ළමයින් හා කාන්තාවන්ට අදාළ තොරතුරු අවශ්‍ය ආකාරයෙන් ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයට ලබා දීම.

- ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය මඟින් අනුයුක්ත කරන ලද කාන්තා කේන්ද්‍ර නිලධාරී සම්බන්ධීකරණයෙන් කාන්තා හිංසනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය සහ ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය නිලධාරීන් සඳහා පැවැත්වීම.

## 3.5. අභ්‍යන්තර විගණන අංශය

- 2015 වර්ෂයේ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරේ පැවති පුරප්පාඩුව 2015.07.06 දින නිලධාරියෙක් පැමිණීම සමඟ සම්පූර්ණ කර ගැනීම.

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අභන්තර විගණන අංශවල සමාලෝචන කටයුතු, විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ ප්‍රගතිය, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය ඇතුළු අනෙකුත් මූල්‍ය හා පරිපාලන කටයුතුවලට අදාළ චක්‍රලේඛ හා නීති රීති අනුව ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ විචලතා සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවනසේ විගණන හා කළමනාකරණ රැස්වීම් දෙකක් වර්ෂයේ අවසාන කාර්තු දෙක තුළ පිළිවෙලින් 2015/08/11 සහ 2015/12/21 යන දිනයන්හිදී පැවැත්වීම.

- අමාත්‍යාංශය සඳහා විගණකාධිපති විසින් නිකුත් කරනු ලැබූ විගණන විමසීම් 02 ක් සඳහා 2015 වර්ෂය තුළ පිළිතුරු සපයා අවසන් කර තිබීම.

- පොලිස් දෙපාර්තමේන්තුවට අදාළ විගණන විමසුම් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ සඳහා පිළිතුරු සැපයීම කඩිනම් කිරීමටත්, ස්ථාවර වත්කම් ලේඛන, බැංකු ගිණුම් හා බැංකු සැසඳුම් වාර්තා ක්‍රමවත්ව පිළියෙළ කිරීමත්, අත්තිකාරම් බී ගිණුමේ හිඟ ණය ශේෂ අයකර ගැනීම හා අලාභ සහ හානි සම්බන්ධයෙන් කටයුතු කිරීම විධිමත් කිරීමටත් අවශ්‍ය මඟ පෙන්වීම් සිදු කිරීම.

- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අදාල විගණන විමසුම් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ සඳහා පිළිතුරු සැපයීම කඩිනම් කිරීමටත්, ස්ථාවර වත්කම් ලේඛන, බැංකු ගිණුම් හා බැංකු සැසඳුම් වාර්තා ක්‍රමවත්ව පිළියෙල කිරීමත්, අත්තිකාරම් බී ගිණුමේ හිඟ ණය ශේෂ අයකර ගැනීම හා අලාභ සහ හානි සම්බන්ධයෙන් කටයුතු කිරීම විධිමත් කිරීමටත් අවශ්‍ය මඟ පෙන්වීම් කිරීම.

- විශේෂ කාර්ය බලකායේ ස්ථාවර වත්කම් ලේඛන සකස් කිරීම බැංකු ගිණුම් හා බැංකු සැසඳුම් වාර්තා පිළියෙල කිරීම, අත්තිකාරම් බී ගිණුමේ හිඟ ණය ශේෂ අයකර ගැනීම හා අලාභ සහ හානි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී එම කටයුතු පවතින මෘදුකාංග යොදාගෙන ඉටු කරන අන්දම පිළිබඳව මඟ පෙන්වීම.

- ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීම, අත්තිකාරම් බී ගිණුමේ හිඟ ණය ශේෂ අයකර ගැනීමේ ප්‍රගතිය, අලාභ හා හානි සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දීම, එමෙන්ම විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමේ අවශ්‍යතාව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට හා ක්‍රිස්තියානි කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවට තහවුරු කරමින් නිසි උපදේශකත්වය ලබා දීම.

- ආයතනවල භාණ්ඩ සමීක්ෂණ කඩිනම් කිරීම හා සියළු සමීක්ෂණ හා අපහරණ වාර්තා අමාත්‍යාංශය වෙත ලබා ගැනීමෙන් අනතුරුව ඒවා නිසි පරිදි සිදුවන්නේ දැයි අධීක්ෂණය කිරීම හා ඊට අදාළ පියවර ගැනීම.